ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
இலங்கைப் பொதுப் பயன்பாடுகள் ஆணைக்குழு
PUBLIC UTILITIES COMMISSION OF SRI LANKA

ඔබේ අංකය / உமது இல. / Your No.
අපේ අංකය / எமது இல. / Our No.
දිනය / திகதி / Date

**<u>ප්‍රවෘත්ති නිවේදනය</u>**

2022 ජනවාරි 27

අද දින සිට ජනවාරි 31 දක්වා විදුලි කප්පාදුවක් සඳහා අවශ්‍යතාවයක් නොමැති බව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව තීරණය කර තිබේ. ඒ අනුව විදුලි කප්පාදුවක් සඳහා ලංකා විදුලි බල මණ්ඩලය කල යෝජනාවට තවදුරටත් අවසර නොලැබේ.

මේ පිළිබඳ වැඩිදුර කරුණු පැහැදිලි කරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සභාපති ජනක රත්නායක මහතා.

"බලාගාර හා ඒවාට අවශ්‍ය ඉන්ධන තොග පිළිබඳ අපි දෛනිකව සමාලෝචනයක් කරනවා. එම සමාලෝචනවල ප්‍රතිඵල අනුවයි විදුලි කප්පාදුවක් කරන්න අවශ්‍ය ද නැද්ද යන්න තීරණය කරන්නේ. අපි පසුගිය අවස්ථා දෙකේදීම එළඹුණු නිගමනය වුණේ විදුලි කප්පාදුවකින් තොරව අඛණ්ඩව සැපයුම ලබාදිය හැකි බව. අද දිනයේදී අපි සමාලෝචනයක් කලා අද සිට 31 වන දා දක්වා තත්වය. හෙට දිනයේ සවස් කාලයේදී ඉල්ලුම සපුරාලීමේදී මෙගා වොට් 30ක පමණ ධාරිතාවයක් නිසි විදියට කළමණාකරනය කරගන්න වෙනවා. ඉන් අනතුරුව එළඹෙන සති අන්තයේ විදුලි ඉල්ලුම අඩුවෙනවා. ඒ නිසා 29 සහ 30 යන සති අන්තයේදී විදුලි කප්පාදුවක් අවශ්‍ය වෙන්නෙ නැ. අපි විදුලි පාරිභෝගිකයන්ගෙන් සහ ආයතනවලින් ඉල්ලාසිටිනවා විදුලිය අරපිරිමැස්මෙන් මේ කාල සීමාව තුල පාවිච්චිකර ලංකා විදුලිබල මණ්ඩලයට සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට සහයෝගය දක්වන ලෙසට"

විදුලි අර්බුදයට පිළියමක් ලෙස රාජ්‍ය ආයතන හා පුද්ගලික ආයතන සතු විදුලි ජනන යන්ත්‍ර කාර්යක්ෂම ලෙස භාවිත කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීමටද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පියවර ගෙන තිබේ.

ඒ පිළිබඳ අදහස් පල කල ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සභාපති ජනක රත්නායක මහතා

"විදුලි ජනන යන්ත්‍ර හිමි රාජ්‍ය ආයතන හා පුද්ගලික ආයතන සමග අපි සාකච්ඡා ආරම්භ කලා. මේ වන විට එවැනි කණ්ඩායම් දෙකක් සමග කල සාකච්ඡා සාර්ථකව අවසන්. අපගේ යෝජනාව සම්බන්ධයෙන් ඔවුන් යහපත් ප්‍රතිචාර දක්වා තිබෙනවා. මුල් අදියරේදී විදුලි හිඟයක් පවතින විටදී ජනන යන්ත්‍ර හිමි ආයතන සිය විදුලි ඉල්ලුම එම ජනන යන්ත්‍රවලින් සපයාගැනීමට දිරිමත් කරනවා. එතකොට ජාතික පද්ධතිය තුල විදුලි ඉල්ලුම අඩුවෙන නිසා හිඟ අවස්ථාවල ඉල්ලුම සපුරාලීම පහසු වෙනවා. මේ වැඩපිළිවෙලේ දෙවන අදියරේදී රාජ්‍ය හා පුද්ගලික ආයතන සතු ජනන යන්ත්‍ර ජාතික පද්ධතියට සම්බන්ධ කර විදුලිය හිඟ අවස්ථාවලදී ඒවායින් ජාතික පද්ධතියට විදුලිය ලබාගැනීම පිළිබඳ සොයාබලා තීරණයක් ගැනීමට නියමිතයි."

ජනක රත්නායක

සභාපති

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

06.වන මහල, ලංකා බැංකු වෙළඳ කුළුණ, 28. ශාන්ත මයිකල් පාර, කොළඹ 03.
06 ஆவது மாடி, இலங்கை வங்கி வர்த்தகக் கோபுரம், 28, சென் மைக்கல் வீதி, கொழும்பு 03.
Level 06, BOC Merchant Tower, 28, St. Michael's Road, Colombo 03, Sri Lanka.

Tel : +94 11 2392607/8 Fax : +94 11 2392641 E-mail : info@pucsl.gov.lk Web : www.pucsl.gov.lk

සභාපති / தலைவர் / Chairman +94 11 2392606
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General +94 11 2392606